# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 59 දරන ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 දෙසැම්බර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 දෙසැම්බර් මස 14 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 7.00 යි.  තැපැල් ගාස්තුව : රු. 5.00 යි

# 2007 අංක 59 දරන ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 දෙසැම්බර් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. (අයි.එන්.සී.) 4/2006.

## ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංවිධානයක්, එකී සංවිධානයට සම්බන්ධ සියලු කටයුතු ඵලදායී ලෙස කරගෙන යාමේ සහ ඒවායේ යෙදීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවාගෙන තිබුණු හෙයින්ද : පූර්විකාව.

එකී සංවිධානය සංස්ථාගත කරන මෙන් ඉල්ලා ඇති හෙයින් සහ එක් ඉල්ලීමට ඉඩ දීම මහජන සුභසිද්ධිය සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2007 අංක 59 දරන ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ සාමාජිකයන් වශයෙන් දැනට සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන සියලු තැනැත්තන්, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නමින් සංස්ථාව විසින් ද, සංස්ථාවට විරුද්ධව ද, නඩු පැවරිය හැකි වන්නේ ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව, සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි වේ :— සංස්ථාවේ පොදු අරමුණු.

(අ) සාම්ප්‍රදායික සංරක්ෂණවාදී කෘෂිකාර්මික ජනජීවිතය වර්තමාන අවශ්‍යතාවයන්ට අනුකූලව වෙනස් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම ;

(ආ) ජන ජීවිතය ශක්තිමත් කිරීමට අවැසි ආකාරයෙන් යහපත් පරිසරයක් සකස් කිරීම සඳහා අදාළ වැඩසටහන් සංවිධානය කිරීම ;

(ඇ) ජනතා සහභාගිත්වය උපරිම ආකාරයෙන් ලබා ගනු පිණිස ප්‍රාදේශීය දිස්ත්‍රික්ක සහ ජාතික මට්ටමින් ජනතා සංවිධාන සමග ජාලයක් සේ කටයුතු කිරීම ;

(ඈ) පරිසර හිතකාමී කෘෂිකාර්මික පරිසරයක් ගොඩනැංවීමට අදාළව පවතින ප්‍රශ්න, ගැටළු සහ විසඳුම් හඳුනා ගැනීම, වැඩ මුළු, සම්මන්ත්‍රණ, සංවාද හා සාකච්ඡා සංවිධානය කිරීම සහ ඒවා ආශ්‍රයෙන් ලබාගත් දත්ත සහ තොරතුරු ලේඛනගත කිරීම ;

(ඉ) නව සංකල්ප, කුසලතා සහ දැනුම පිළිබඳ මහජනතාවගේ දැනුවත් බව ඇති කිරීම පිණිස පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම ;

(ඊ) ජනතා නැඹුරුවත්, ධුවමතාවත්, විශ්වාසයත් තහවුරු වනු පිණිස ශ්‍රී ලංකාවේ විවිධ දේශගුණික භූගෝලීය කලාප තුළ පර්යේෂණ අත්හදා බැලීම්වල වාර්තා, ආදර්ශණ හා තොරතුරු ඇතුළත් ක්ෂේත්‍ර මධ්‍යස්ථාන හා ගොවිබිම් ඇති කිරීම ;

(උ) ජනතාවගේ නිරෝගී බවත්, සෞඛ්‍යයත් රැකෙන පරිද්දෙන් පරිසර හිතකාමී කෘෂි සහ කර්මාන්ත නිෂ්පාදන පදනමක් ගොඩනැගීම සඳහා නිෂ්පාදන ප්‍රවර්ධනයට අදාළ දිරිගැන්වීම් ලබාදීම ;

(ඌ) දේශීය බව භෝග අංශයේ සහ අපනයන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ යෙදී සිටින ජනතාවට ඒ සඳහා ආධාර ලබාදීම සහ ඒ අංශවල නිෂ්පාදන ඵලදායීතාව වර්ධනය කිරීම ;

(එ) ඉඩම් සංවර්ධනය සහ කෘෂිකාර්මික කටයුතු කළමනාකරණය කිරීම භාර ගැනීම ;

(ඒ) ග්‍රාමීය සුළු කර්මාන්ත සහ ස්වයං රැකියා ජනනය සඳහා ආධාර කිරීම හා අනුබල දීම ;

(ඔ) තිරසාර සංවර්ධනය සහ පරිසර සංරක්ෂණයට අදාළ වන්නා වූ දේශීය පැලෑටි සහ ශාක සංරක්ෂණය කිරීම, ආරක්ෂා කිරීම සහ ව්‍යාප්ත කිරීම.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට, යටත්ව පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය :— සංස්ථාවේ බලතල.

(අ) බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ ඒවා වසා දැමීම ;

(ආ) ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබාගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීම හා එකතු කිරීම ;

(ඇ) සංස්ථාවේ කාර්යයන් සඳහා අත්‍යාවශ්‍ය නොවන අරමුදල් කිසිවක් ආයෝජනය කිරීම ; සහ

(ඈ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකරගෙන යාම සඳහා අවශ්‍ය සේවා නියුක්තිකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම සහ සේවයෙන් පහ කිරීම සහ සංස්ථාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් පාරිශ්‍රමික ඔවුන්ට ගෙවීම.

5. (1) මේ පනතේ විධිවිධාන සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු කළමනාකරණය, පාලනය සහ පරිපාලනය, සභාපති, උපසභාපති, සම ලේකම්වරු දෙදෙනකු සහ භාණ්ඩාගාරික යන අයගෙන් සමන්විත ක්‍රියාකාරී කමිටුවක් මගින් පාලනය කළ යුතු ය. සංස්ථාමේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) සභාපතිවරයා විසින් ක්‍රියාකාරී කමිටුවේ සෑම රැස්වීමකම මූලසුන දැරිය යුතු ය. ක්‍රියාකාරී කමිටුවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටි අවස්ථාවක දී උප සභාපතිවරයා විසින් ඒ රැස්වීමේ මූලසුන දැරිය යුතු ය.

(3) ක්‍රියාකාරී කමිටුවේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහිලා හෝ නම් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් ක්‍රියාකාරී කමිටුවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බල රහිත වන්නේ යයි නොසැලකිය යුතු ය.

(4) සංස්ථාවේ ප්‍රථම ක්‍රියාකාරී කමිටුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරයේ ක්‍රියාකාරී සාමාජිකත්වය දැරුවා වූද තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය.

මෙහෙයුම් කමිටුව.

6. සභාපති, උපසභාපති, සම ලේකම්වරු දෙදෙනා, භාණ්ඩාගාරික සහ සාමාජික සංවිධාන නියෝජිතයන් පස්දෙනකුගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් තිබිය යුතු වන්නේ ය.

සංස්ථාවේ රීති.

7. (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී රට පැමිණි ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකත්වය වර්ගීකරණය කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කරගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ නෙරපීම ;

(ආ) සංස්ථාවේ නිලධරයන් තෝරාපත් කරගැනීම, එම ධුර දරන්නන්ගේ ඉල්ලා අස්වීම සහ ධුරය හිස් කිරීම, ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, ක්‍රියාකලාපය සහ කාර්යයන් ;

(ඇ) ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කිරීම සහ එහි බලතල, ක්‍රියාකලාපය, කාර්යයන් සහ ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ඈ) සංස්ථාවේ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, ක්‍රියාකලාපය, කාර්යයන් සහ කර්තව්‍යයන් ;

(ඉ) ක්‍රියාකාරී කමිටුවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී පිළිපැදිය යුතු කාර්ය පරිපාටිය, එම රැස්වීම පැවැත්විය යුතු වේලාවන්, ස්ථාන, එම රැස්වීම්වල න්‍යාය පත්‍ර, ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය හා සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උප වගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් එවැනිම රැස්වීමක දී සහ එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාර ගනු ලබන ත්‍යාග, තෙස්තමේන්තු නියාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ප්‍රදාන හෝ ගාස්තු කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි බැංකුවක හෝ බැංකු වැඩිගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල්.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා සංස්ථාව විසින් ක්ෂය අරමුදලක් හෝ තිදන් අරමුදලක් ඇති කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ බලතල සහ කාර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද සියලුම වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

9. (1) සංස්ථාවට ලැබුනු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව තියි ගිණුම් පවත්වාගෙන යාමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාවේ ගිණුම්, සෑම වර්ෂයකම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, සංස්ථාව විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු විය යුතු විගණකවරයකු හෝ විගණකවරුන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු හෝ සංගමයට අයවිය යුතු ණය.

10. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති සංගමය විසින් ගෙවිය යුතුව තිබුණු සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ ලැබිය යුතුව තිබුණු සියලු සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

11. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ රීතිවලට යටත්ව ඒ සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු තවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායම් හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතන කවරේදැයි සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

13. සභාපතිවරයා සහ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් දෙදෙනාම ඒ සාධන පත්‍රයේ තම නම් අත්සන් කළ යුතු ය. තව ද, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

14. සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ මහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගාස්තුවල ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

**15.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ. ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.